"සමන් දන්නව ද....." මමත් තවම ආසයි බස් එකේ උඩ තට්ටුවේ යන්න....." ගුණපාල මහත්තයා සිනාසෙයි. මම ද සිනාසුනෙමි....." ඕනෑම කෙනෙක් කොයිතරම් වැඩිහිටි වුණත් තමන්ගෙ ළමා කාලයෙන් ටිකක් ඉතුරු කරගන්න ඕනේ...." එතකොට තමයි ජීවිතේ සම්පූ, වෙන්නෙ....." (පිටු 108)

යම් නිර්මාණයක් විදිමේ අවසානයේ අප වෙත ඉතිරි වන්නේ කිමෙක් ද? එයයි විදින්නා හට වඩාත් වැදගත් වන්නේ. ආනන්දයෙන් අරබී ප්‍රඥවෙන් අවසන් විය යුතුයැයි කියැවෙන කියමන කිනම් හෝ කලාවක් අරබයා වුවද සත්‍යයකැයි හැඟෙනුයේ ඒ නිසාවෙනි.

ජගත් ජේ. එදිරිසිංහයන්ගේ ගද්‍ය හා පද්‍ය රචනා මෙන්ම ගේය පද රචනා ද මින් පෙර විඳ ඇත්තෙමු, අපි ඒ සෑම වතාවක දීම ඒ පිළිබඳව දෙවරක් සිතන්නට, කතාකරන්නට, ලියන්නට කරුණු කාරණා බොහෝ විය. එදා විචාරයට, ආධුනිකයෙකු වූ නිසාවෙන් සහ අප අතර බැඳි ළඟැඳියාව හේතුවෙන් මා ඊට නුසුදුස්සෙකැ'යි මම තීරණය කළෙමි. ඒ කාරියයට අත පෙවූ වියතුන් ගේ අදහස් සුහුඹුලෙකු මේ කියැවුයෙමි. කෙසේ වුවද ග්‍රන්ථ විචාරයට අතපොත් තැබීමට සුදුසු ප්‍රස්තකයක් කතුවරයා අතින්ම පිරිනමුණොත් මෙවර නම් ඉන් මිදිය නොහේ.

*දක්ෂයාට එල්ලවන ගල්" මුල් කැපිලි"කෙටිලි වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ කලා ක්ෂේත්‍රයට තුලයි. ඒ නිසා-වෙන් දෝ කතුවරයා උපයෝගී කරගන්නේ එවන් හැකියාවන් ඇති චරිතයකි.*

දෙස උපසාසයෙහි සමන් බලන්නේ, පරීක්ෂකවරුන් සිසුන්ගෙන් ප්‍රශ්න අසනා අවස්ථාව වැඩිහිටි පාඨකයගේ පවා කුතූහලය දනවන ලෙසිනි. ලියැවී ඇත්තේ. කතුවරයාගේ අනෙකුත් ග්‍රන්ථවල පවා අප දැක ඇති කුසලතාවකි ඒ.

"පරාතුම සමුදුයේ බැමිම කැඩී ගියා සේ....." (පිට 25) සුමනසිරි පරීක්ෂකවරුන්ගෙන් ඇසු ප්‍රශ්ණයට සැවොම සිනා සුනු ආකාරය එකී වයසේ දරුවකු දැක්වූ අන්දමයි. ඒ කතුවරයා ළමා චරිතයට පණ පොවන්නේ තෙමේ ම එය ආරූඪ කරගනිමිනි.

කලා ක්ෂේත්‍රයට තුලයි. ඒ නිසාවෙන් දෝ කතුවරයා උපයෝගී කරගන්නේ එවන් හැකියාවන් ඇති චරිතයකි.

"ඔය ළමයා මෙහෙන් ඉන්න....." ඈ රහසින් නමුත් දැඩි ස්වරයෙන් කීවාය.

"මම වේදිකාව දෙස බැලුවෙමි. සුදට සුදේ බබලන ඇළුත් ව ආරිය සිංහල ඇඳුමකින් වේදිකාව මැද සිටගෙන සිටියේ අපේ යාවජීව පන්ති නායක අනුරය. (පිට 44)

නායකත්වයට මෙන්ම වේදිකාවට ද අනුර සුදුසුකම් ලබන්නේ මානසික සබඳතාවයක් නිසාවෙනි. එමෙන්ම සමන් වෙත "කැපිලි" එල්ලවීමට හේතුව වන්නේ ද අනිසි මානුසික සබඳතාවයක රහස දැනගත් සාක්ෂිකරු වීමේ අවාසනාව නිසයි. බුද්ධිය පාලනය කරගත නොහී උගතුන් හට කතුවරයා ඇඟිල්ල දිගු කරන්නේ පාඨකයාගේද සංවේගය දල්වමිනි දිගින් දිගට ම එකී අසහනකාරී , අමිහිරි සිතුවිලි ම පෙළ ගැන්වීමෙන් මිදී හාසය, උපහාසය, ත්‍රාසය , දඟකාර-කම්වලින් පාඨක සිත පුරවාලීමට කතුවරයා උනන්දු වෙයි. එද මේ සියළු දෑ යාකරන සියුම් නුයක් සේ දිවෙන්නේ පාසැල් සමාජ උපකුලකයේ දී අසරණ වන ප්‍රධාන චරිතයයි. ඒ දෙස මානුෂික ලෙසින් බලනා චරිත කීපයක් ද නැතිවා නොවේ. මුලදී ඔවුන්ද බලවතුන් ඉදිරියේ විපිළිසරණ වුව ද අවසන සියල්ල කෙළවර වන්නේ "සත්‍ය ජයගනී" "උත්සහවන්තයා ජයගනී" යන දේ පසක් කරවමිනි. කෙනෙකුගේ හැකියාවන් සැඟවීමට, යටපත් කරවීමට කොතෙක් උත්සහ කළ ද දියයට බලයෙන් ඔබාගෙන සිටිවා රබර් බෝලයක් අවසර ලත් සැණින් දිය මතුපිටට එන්නා සේ ඒවා ඉස්මතු වීම වැළැක්විය නොහේ. කෙතරම් අකාරුණික සමාජයක වුව ගුණ ගරුක, සත්‍ය ගරුක දනන්ද වේ. කතුවරයා වෙතින් "ඉස්කෝලේ කාලෙන්" පාඨකයා වෙත පිදෙන හරයන් ය ඒ.

*ජගත් ජේ. එදිරිසිංහයන් ගේ "ස්කෝලේ කාලේ " යොවුන් නවකතාව පිළිබඳව අදහස් දැක්වීමක් ....*

# ආයෙමත් ඉස්කෝලේ කාලෙට!

කුඩා පාසැල් දරුවකු ලෙසින් එදිරිසිංහයන් ගේ " ඉස්කෝලේ කාලේ " එක නුයිමට කියවා දැමුවෙමි මම. යොවුන් නවකතාවක් ලෙසින් ගොඩගේ පොත් මැදුරෙන් එළිය දුටු සමන් ගේ "ඉස්කෝලේ කාලේ " අප සැමගේ ම ඉස්කෝලේ කාලයයි. ගුණපාල ගුරුමහත්මා කී ආකාරයෙන්ම අපගේ යටි සිතෙහි අදටත් වමත්කාරය අදනා ඉස්කෝලේ කාලය පිළිබඳව මතක පිටු කීපයකුයි මේ. අසුව දශකයේ මුල් භාගයේ දී විශාල වශයෙන් සංවර්ධනයට

*පරීක්ෂකවරුන් සිසුන්ගෙන් ප්‍රශ්න අසනා අවස්ථාව වැඩිහිටි පාඨකයගේ පවා කුතූහලය දනවන ලෙසිනි. ලියැවී ඇත්තේ. කතුවරයාගේ අනෙකුත් ග්‍රන්ථවල පවා අප දක ඇති කුසලතාවකි ඒ.*

ලක්වු ගැමි වටපිටාවක සේයාව කතුවරයා අප මනසෙහි චිත්‍රනය කරනුයේ චමත්කාර ලෙසිනි. එකී පරිසරයේ ම වැඩුණ දරුවකු වූ නිසාවෙන් ඔහු ඊට වඩාත් වරම් ලබයි. නමුත් ඒ සඳහා කතුවරයා ඊට යුහුසුළු නොවෙයි. ඔහුගේ මාතෘකාව පාසැලයි. පරිසරය විස්තර කිරීම් වෙනුවෙන් ඡේද වෙන් කෙරෙනුයේ පාසැලේ සිද්ධීන් අතරිනි. ඒවා ආයාසයෙන් රිංගවූ විෂයක්‍රාන්ති වර්ණනාවන් නොවේ. අඳුල වයසේ දරුවෙකු දකින පාරිසරික රූප පමණකි. එයයි විශේෂත්වය. මුහුකුරා ගිය වැඩිහිටියෙකු දකිනා පාරිසරික රූපකයක් නොවීම යොවුන් පාඨකයාගේ සතුටට හේතු වේ.

"අප වෙලට ගොඩවෙන තැන ඇත්තේ අයාලේ යන ගවයන්ගෙන් නොයම ආරක්ෂා කරගනු වස් ගොවියන් විසින් බඳින ලද කඩුල්ලකි. මා සිටියේ මේ කඩුල්ල උඩ දෙපා දෙපසට දමාගෙන වාඩි වී ගෙනය. පද්මසිරි වෙලට බසින තැන ඇති දෙපාවේ සිහිල් දියෙන් දෙපා සෝදමින් මා දෙස බලා සිටියේ ය....." (පිටුව 17)

අනවශ්‍ය වැනුමින් තොරව කතුවරයා ළමා සිතුවිලි ඒ අයුරින්ම රැකීමට දැක්වූ සංයමය අගය කළ යුතුයි. සිද්ධිනට පරිසරය අනායාසයෙන් බද්ධ වී ඇත්තේය.

කුඩා දරු දැරියන්ගේ උසුළු විසුළු, පට බැඳි නම් යනාදිය ගෙන හැර දැක්වීමේදී ඒ දේ පාඨකයාට හා එකී චරිතවලට ආගන්තුක නොවී අනායාසයෙන් ඇතුලත් කෙරෙනුයේ අන්තර්ගතයට අවශ්‍යම අංග ලෙසිනි.

"වටිටි අම්මා" අමරේ ඇද කළේය. "කැවුමා....."

"ඔය දෙන්නා ඕකට ඔය හැටි කලබල කරගන්න ඕන නැහැ,"ඔය දෙන්නා හැබෑවටම කසාද බඳින්නෙ නැහැනෙ..." පන්තියේ කටකාරියක වූ කුසුමා කීවේ සැවොම සිනහ ගස්සමිනි.

"හිතේ ඇති" අනෝමා මුනු මුනු ගෑවාය."(පිට 19)

දඟකාර දැරියක ගස්සමින් "හිතේ ඇති" යන්න කියනා අන්දම කදිමට මවා පෙන්වනවා නොවේද?

පාසැල් පරීක්ෂක මහත්වරුන්ගේ පැමිණීම වෙනුවෙන් ගුරුවරුන් සුදනම් වන ආකාරය සිසුන්ගේ කෝණයෙන් පාඨකයා වෙත පිරිනැමෙන්නේ හාස්‍යය මෙන් ම උපහාසයද දනවමිනි. කලින් ඉගැන්වූ පාඩමක් හොඳින් ගෙදරදී පාඩම් කරගෙන එන්නට උපදෙස් දෙන ගුරුවරිය පරීක්ෂකවරුන් ඉදිරියේදී එය යළි ඉගැන්වීම "තරහා ගිහින් ?" තරහා නොගිහින් තියේද මේ ඔයගොල්ලෝ කරන වැඩවලට ?" සමන්මලි නෝනා ඔසරි පොට ඉණවටා දවටා ඉදිරිපසින් ඉණ තුරෙහි ගසා ගත්තාය. මට එක වරටම සිහියට ආවේ ඇඹුල්දෙණිය හන්දියේ චණ්ඩි සෝමේවය..." (පිට 28)

චරිත මැවීමේ දී හා සිද්ධීන් විස්තර කිරීමෙහිලා දක්වන හසළ දක්ෂතාවය කතුවරයා පෙන්වන්නේ සිය සමාජයීය වටපිටාවන්ගෙන් උකහා ගත්

**සිසිර දිසානායක**

සම්පත් ද උපයෝගී කරගනිමිනි. "ඊල් පිස්සා", "හොඳ නැන්ද", "කසිප්පු සිරා", "කවිසේකර මහත්තයා" වැනි චරිත ඒ පටබැඳි නම්න්ම හඳුනාගත හැකි වන සේ ඉදිරිපත් වීම පාඨකයා තමා වෙත නතුකර ගැනීමට ගන්නා ලද සාර්ථක උත්සාහයකි. වෙසෙසින්ම යොවුන් පාඨකයින් ඉලක්කකරගත් මෙවන් නවකතාවක අවශ්‍යම ලක්ෂණයකි.

පරිච්ඡේද වශයෙන් වෙන් වෙන්ව මාතෘකා යටතට ලියැවුණද ඒ සියල්ල එකම නවකතාවකට බැඳී නිර්මාණය වූ සිද්ධීන් පෙළකි. ඒ තුලින් කතුවරයා සමාජ අසාධාරණය සියුම් ලෙස පෙන්වන්නේ ඉතාම සරළ ළමා අත්දැකීම් ඇසුරු කරගනිමිනි. සුපුරුදු පරිදි අසාධාරණයට ලක්වන්නේ පාසැල් සමාජයේදී හච්ඡරාණන් නැතිවන දරුවාගි. ඔහුට සිටින්නේ තමන් වැනිම වූ පන්ති මිත්‍ර පිරිසක් පමණකි. අසාධාරණයට ලක්වීමට හේතුව වන්නේ ඔහු සතු වූ නිසඟ හැකියාවන්ය. දක්ෂයාට එල්ලවන ගල්"මුල් කැපිලි"කෙටිලි වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ

*දක්ෂයාට එල්ලවන ගල්" මුල් කැපිලි"කෙටිලි වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ කලා ක්ෂේත්‍රයට තුලයි. ඒ නිසා-වෙන් දෝ කතුවරයා උපයෝගී කරගන්නේ එවන් හැකියාවන් ඇති චරිතයකි.*

ස්කෝලේ කාලේ රස බිඳෙන් බිඳ ගෙන යන ඉදිරිගමනේදී කතුවරයා මේ විස්තීර්ණ සමාජයෙන් උකහාගත් වඩාත් සංකීර්ණ වූ අත්දැකීම් මේ සරළ බවින්ම ඉදිරිපත් කෙරෙනු ඇතැයි අපගේ බලාපොරොත්තුවයි. ජගත් ජේ. එදිරිසිංහ ළඳැදියාණන්ගේ ඉදිරියට අපේ සුභාශිංසන !

නවකථාව කියැවීමේදී නිතැතින්ම සිහියට නැගෙන්නේ කතුවරයාවයි. දන්නා හඳුනන්නෙකු වීමේ අවාසිය මෙහිදී අපට දැනෙයි. තමන්ගේම ආත්මකථනයක් නොවී අත්‍යයන්ගේ අත්දැකීම්ද මුහුකරගනිමින් වඩාත් සවාසක්ත වූ ළමා චරිතයක් මවන්නට උත්සහ කරනා තරමට කෘතිය සාර්ථක වන්නේය. මා'පියාණන් අතින් නිළිණ වී ජීවිතයේ මුල්වරට මා කියැවූ නවකථාව වන ටී.බී. ඉළංගරත්නයන්ගේ "අඹයාළුවෝ " යොවුන් නවකථාව මෙහිදී සිහියට නැගේ.

ඉස්කෝලේ කාලේ රස බිඳෙන් බිඳ ගෙන යන ඉදිරිගමනේදී කතුවරයා මේ විස්තීර්ණ සමාජයෙන් උකහාගත් වඩාත් සංකීර්ණ වූ අත්දැකීම් මේ සරළ බවින්ම ඉදිරිපත් කෙරෙනු ඇතැයි අපගේ බලාපොරොත්තුවයි. ජගත් ජේ. එදිරිසිංහ ළඳැදියාණන්ගේ ඉදිරියට අපේ සුභාශිංසන !

---

13 වන පිටෙන් - බක් මහ උළෙල

කරමින් ඔවුන් තුළ ඊට ආසාවක් ඇති කිරීමත් අපේ එක් පරමාර්ථයක් බව කිව යුතුයි. මා දන්නවා මෙම ක්‍රීඩා වලින් අපේ දරු දැරියන් අතර දැනටමත් ඉතා ජනප්‍රිය තරග වන අත්ලෙන් වතුර පිරවීම, බිත්තරය ඇල්ලීම, සහ කණා මුට්ටිය බිඳීම වැනි බොහෝ තරග වලට අමතරව සෑම වසරකම වගේ අපි අලුතින් තරගයක් හඳුන්වා දෙනවා. මෙවරත් අලුත් තරගයකට සහභාගිවීමේ අවස්ථාව ඔබට ලබා දීමට අපි අමතක කර නැති බව කිව යුතුයි.

සංගමයේ උප ලේකම් රෝහණ අමරසිරි මහතා උළෙලේ අසිරිය වැඩි කරන තවත් අංගයක් අපට සිහිපත් කළේ ය. ඒ බක්මහ රෑ රැජින තේරීමේ තරගයයි. මෙල්බන් නුවර තරුණියන්ට සහභාගි වීය හැකි මේ තරගයේ ජයග්‍රාහිකාවනට වටිනා තෑගි ලබා දීමටද කටයුතු කර ඇති බවත් අයැදුම් පත් ඉක්මණින් එවීන මෙන්ද ඉල්ලා සිටියේ ය.

ඒ සියලු විස්තර අපට පෙන්නුම් කළේ තවත් අසිරිමත් බක් මහ උළෙක් විඳ ගන්න්ට අපට ඉඩ ලැබෙන බව ය.

වසර 30 කට වඩා පැරණි මෙම බක්මහ උළෙලේ ඉතිහාසය පිලිබඳ විස්තරයක් කළේ මෙල්බන්හි ශ්‍රී ලංකා කොන්සල් බන්දු දිසානායක මහතා ය.

"මෙම අවුරුදු උත්සවයේ ඉතිහාසය ඉතා රසවත්. වසරින් වසර පැවැත්තූවූ අවුරුදු උත්සව එකින් එක මගේ මනසේ මැවී පෙනෙනේනේ නොයෙකුත් සන්ධිස්ථාන සිහිකරවමිනුයි. 1984 වසර සිංහල දෙමළ බේධයකින් තොරව එකට එක් වී මෙම වැදගත් සංස්කෘතික උළෙල සැමරූ අවසාන වසර ලෙස මට මතකයි. එදා මහාචාර්ය එඩිසන් මහතාගේ දුව අසූරු භරත නර්තනයකින් උළෙල අලංකාර කළා මට මතකයි. මුළින්ම අපි හත් අට දෙනෙක් එක් වී ඩොලර් 25 බැගින් එකතු කර පටන් ගත් මෙම උළෙල අද මහා දැවැන්ත උත්සවයක් කරා ආ එක අසූරුයි.

මොනෑෂ් ක්‍රීඩා පිටියෙන් ආරම්භ කළ මෙම බක්මහ උළෙලේ රසමුසු අතීත සිහිවටන අතරට මුල්ම සජීවී විස්තර ප්‍රචාරයට එක් වූ අවස්ථාව සිදුවුණේ ඩන්කන් මැකිනොන් ක්‍රීඩාගනයේදීයි. ඒ වෙනකොට ජංගම දුරකතන නොතිබුණ අතර විශේෂ ජංගම දුරකතන ඒකකයක් කුලියට ලබාගෙන ඒ කර්තව්‍යය කළ දින අපි තවත් අලුත් අත්දැකීමක් ලැබුවා. මේ කාතල වල ඊට විහාල වශයෙන් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන් මෙරටට සංක්‍රමණය වෙමින් තිබූ යුගයයි. ඔවුන් විසින් මේ සමාජය තුළ පෙන්වන ලද ඉතා ඉහළ ශිල්පීය හා සංවිධාන ශක්තිය තුළ මේ උළෙල පවත්වාගෙන යාමට ඉතාම සුදුසු කණ්ඩායම ඔවුන් බව අපට පෙණුනා. ඒ විශ්වාසය එළෙසම තබමින් වදා 1994 දී සිට අ දක්වා ඔවුන් ඉතා ඉහළින් මේ කටයුත්ත කරගෙන යනවා. මේ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වදා 1984 ට පෙර අපි සිංහල හා දෙමළ සියලු දෙනා එක්ව සැමරූ කාලය සිහිපත් වෙනකොට එක්සත් වූ ශ්‍රී ලංකාවක සිටින ශ්‍රී ලාංකිකයන් වශයෙන් නැවතත් එක්ව සැමරීමට හැකි වේවායි අවසන් වශයෙන් මම ප්‍රාර්ථනා කරනවා"

**සන්නස**